**ශීර්ෂය 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව**

-------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මතය

-------

ශීර්ෂය 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 03 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

---------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයක් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් රු.19,930,000 ක ප්‍රතිපාදනය සලසා තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් කිසිදු උපයෝජනයක් නොකිරීම නිසා එම ප්‍රතිපාදනය මුළුමනින්ම ඉතිරි කර තිබුණි. | රාජ්‍ය වියදම් සීමා කිරීමේ ප්‍රතිපත්තිය මත භාණ්ඩාගාර ලේකම්ගේ උපදෙස් පරිදි ප්‍රතිපාදන අවුරා තැබීම, ගෙවීම් කිරීම සඳහා රාජ්‍ය නොවන ආයතනවලින් අදාළ වවුචර් පත් ඉදිරිපත් නොවීම මත ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | මු.රෙ.50 ප්‍රකාරව නිවැරදිව හා තාර්කිකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 06 ක් හා මූලධන වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.38,145,580 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 31 ක සිට සියයට 94 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. කෙසේ වුවද, මෙම ඉතිරිවීම් භාණ්ඩාගාර ලේකම්ගේ උපදෙස් මත ප්‍රතිපාදන අවුරා තැබීම නිසා සිදු වූවක් බව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | රාජ්‍ය වියදම් සීමා කිරීමේ ප්‍රතිපත්තිය මත භාණ්ඩාගාර ලේකම්ගේ උපදෙස් පරිදි ප්‍රතිපාදන අවුරා තැබීම, ගෙවීම් කිරීම සඳහා රාජ්‍ය නොවන ආයතන වලින් අදාළ වවුචර්පත් ඉදිරිපත් නොවීම මත ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | මු.රෙ.50 ප්‍රකාරව නිවැරදිව හා තාර්කිකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| 2021 දෙසැම්බර් 30 දිනැති අංක SA/MAA/02/01/01 දරන රාජ්‍ය ගිණුම් | 2021 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය සෘණ රු. 3,509,894 ක් වී තිබුණි. සංශෝධිත | SA/MAA/02/01/01 දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව ACA-7 ආකෘතිය සම්පූර්ණ කර ඇති අතර, | මූල්‍ය ප්‍රකාශන තාර්කිකව පිළියෙළ කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් ගේ ලිපිය | ACA – 7 ආකෘතියේ සඳහන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගැලපුම් ශේෂය ඍණ (-) රු.3,509,894 ක් වී තිබුණත්, එය රු.3,509,894 ක් විය යුතුව තිබුණි. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඍණ (-) රු.3,509,894 ක ශේෂයට අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ලබා ගත යුතු ධන (+) රු.3,509,894 අග්‍රිම ගැලැපුම් ශේෂය ගැලැපූ විට අග්‍රිම ගිණුමේ ශේෂය රු.0 ක් විය යුතුව තිබුණි. නමුත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අග්‍රිම ගැලැපුම් ශේෂය ඍණ (-) රු.3,509,894 ක් ලෙස දැක්වීම නිසා 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය 0 (ශූන්‍ය) ක් ලෙස දැක්වීම තාර්කිකව සිදු වී නොතිබුණි. | එහි සඳහන් ආකෘතියට කිසිදු වෙනසක් සිදු නොකර, ආදාළ විස්තරය ඉදිරියෙන් අයිතමයන්හි මූල්‍ය අගයන් සඳහන් කර ගැලපීම් සිදු කර ඇති අතර, එහිදී අග්‍රිම ගැලපුම් ශේෂය ලෙස ඍණ රු. 3,509,894 ක අගයක් ලෙස පෙන්නුම් කර ඇත. |

**2.3** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 දෙසැම්බර් මාසයේදී වැය විෂයයන් දෙකක් යටතේ පිළිවෙලින් රු.466,487 ක් හා රු.61,640 ක් වශයෙන් එකතුව රු.528,127 ක බැරකම්වලට එළඹ තිබුණත්, මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බැරකම් හා බැදීම් ප්‍රකාශවල එම බැරකම් ඇතුළත් කර නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් භාණ්ඩ ලැබී නොතිබූ බැවින්, බැරකම් සඳහා 2103 වැය විෂය යටතේ එළඹ ඇති අතර, එය බැරකම් ලේඛනයේ සටහන් කිරීමේදී 2108 ලෙස මුද්‍රිත දෝෂයකින් සටහන් වී ඇත. | සමාලෝචිත වර්ෂයට අදාළ බැරකම් නිවැරදි ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු වීම. |

**2.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අගෝස්තු 11 දින මියගිය නිලධාරියෙකුගෙන් හා 2021 ජුලි 20 දින සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු එකතුව රු.424,716 ක ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | මරණ පාරිතෝෂිතයෙන් අයකර ගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත.<br><br>2021.07.20 වන දින වැඩ තහනම් කරන ලද නිලධාරිනියගෙන් රජයට අයවිය යුතු ආපදා ණය ශේෂය නිරවුල් කරන ලෙස නිලධාරිනිය වෙත 2022.01.19 දිනැති ලිපිය මගින් ලිඛිතව දැනුම් දී ඇත. | හිඟහිටි ණය ශේෂ අය කර ගැනීමට ප්‍රමාණවත් පියවර ගත යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරමින් පවතින CS-DRMS ණය කළමනාකරණ පද්ධතිය ණය සේවාකරණ පුරෝකථන ඇතුළු කාර්යයන් සඳහා හඳුන්වා දී ඇති පද්ධතියක් බවත්, ඒ අනුව ණය පිළිබඳ දත්ත ITMIS වෙත මාර්ගගත ක්‍රමයට යොමු කිරීම පිළිබඳව අදාළ ආයතන සමඟ සාකච්ඡා සැලකිය යුතු ප්‍රමාණයක් සිදු කළද, තාක්ෂණික ගැටළු හා තරමක යල් පැන ගිය CS-DRMS පද්ධතිය ITMIS සමඟ සම්බන්ධ කිරීම දුෂ්කර කාර්යයක් වී ඇති බවත් විගණනයට දන්වා තිබුණි. ණය කළමනාකරණ කටයුතු සමඟ මුදල් ප්‍රවාහ කළමනාකරණය හා ණය | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 30/94 හා 1994.04.20 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව විදේශ ආධාර වාර්තා කර ගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් CS-DRMS දත්ත පද්ධතිය භාවිතා කරනු ලැබේ. | ණය කළමනාකරණ හා සේවාකරණ කාර්ය සඳහා ගිණුම්කරණ හා මුදල් ප්‍රවාහ පහසුකම් සහිත පද්ධතියක් යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ගනුදෙනු ගිණුම්ගත කිරීමේ පහසුකම් සහිත හා/හෝ CS-DRMS පද්ධතියෙන් ITMIS පද්ධතියට අවශ්‍ය දත්ත හුවමාරු කළ හැකි පහසුකම් සහිත ණය කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීමට දෙපාර්තමේන්තුව 2022 මැයි මාසය අවසන් වන විටත් ක්‍රියා කර නොතිබුණි. | | |
| (ආ) | 2021 වර්ෂයේදී ගිවිසුම්ගත වූ නමුත් උපලබ්ධි නොවූ විදේශ ණය වර්ග දෙකක් සඳහා පොලී ලෙස රු.462,721 ක් හා වෙනත් ගෙවීම් ලෙස රු.5,710,641 ක් ගෙවා තිබුණි. | 2021008, 2021016 ට අදාළ ප්‍රතිලබ්ධි වටිනාකම පද්ධතියේ සටහන් කිරීම අතපසු වීමකින් ප්‍රමාද වී ඇති අතර, පද්ධතිය යාවත්කාලීන කර ඇත. ඉදිරියේ දී එවැන්නක් සිදුනොවීම සඳහා අභ්‍යන්තර ක්‍රමවේදයක් සකසා ඇත. | ප්‍රතිලබ්දි වටිනාකම් නිවැරදිව හා අප්‍රමාදව පද්ධතියේ සටහන් කළ යුතු වීම. |

(ඇ) 2021 වර්ෂයේ කාර්යසාධන සැලැස්මට අනුව ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සහ තථ්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම පහත පරිදි විය.

| **සංවර්ධන පාර්ශවකරු** | **ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව 2021 (එ.ජ.ඩො.මිලියන )** | **තථ්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම 2021 (එ.ජ. ඩො.මිලියන)** | **විචලනය (එ.ජ.ඩො. මිලියන)** | **විචලනය , ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට** |
|---|---|---|---|---|
| ලෝක බැංකුව | 276 | 434 | 158 | 57 |
| ආසියානු සංවර්ධන බැංකුව | 390 | 615 | 225 | 58 |
| චීනය | 312 | 969 | 657 | 211 |
| ජපානය | 178 | 135 | 430 | 24 |
| කොරියාව | 20 | 11 | 90 | 45- |
| මැදපෙරදිග රටවල් | 82 | 44 | 38 | 46 |

| | | | | |
|---|---|---|---|---|
| දකුණු ආසියානු රටවල් | 62 | 87 | 25 | 40 |
| රුසියාව , ඔස්ට්‍රේලියාව සහ බටහිර රටවල් | 210 | 111 | 99 | 47 |
| එක්සත් ජාතීන්ගේ සංවිධාන | 16 | 12 | 4 | - 25 |
| **එකතුව** | **1,546** | **2,418** | **872** | |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (i) | 2021 වර්ෂයේදී ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවේ මුළු වටිනාකම එ.ජ.ඩොලර් මිලියන 1,546 ක් වුවද, සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම එ.ජ.ඩොලර් මිලියන 2,418 ක් වීම හේතුවෙන් තථ්‍ය උපලබ්ධි වටිනාකම, ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවට වඩා එ.ජ.ඩොලර් මිලියන 872 කින් එනම්, සියයට 56 කින් පමණ වැඩි වී තිබුණි. | 2021 වර්ෂයේදී මෙරට ආර්ථිකයේ ඇතිවූ අස්ථාවරභාවය හා විදේශ විනිමය අර්බුදය සමනය කිරීම සඳහා අයවැය මූල්‍යයන සහාය සඳහා ලබාගත් වෙළෙඳපොළ ණය හේතුවෙන් හා කොවිඩ් 19 තත්ත්වය පාලනය කිරීම සඳහා අතිරේක එන්නත් මාත්‍රා නිර්දේශ කිරීම යටතේ ඒවා ලබා ගැනීමට ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක බැංකුව වෙතින් කොවිඩ් 19 අතිරේක හදිසි ණය පහසුකම් ලබාගැනීමට සිදුවීම හේතුවෙන් ද සැලසුමට සාපේක්ෂව 2021 දී සමස්ත ප්‍රතිලබ්ධි අගයේ වැඩි වීමක් සිදුව ඇත. | විධිමත් පරිදි සැලසුම් සහිතව විදේශ ණය මූල්‍යාණයන් සිදු කළ යුතු වීම. |
| (ii) | ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවට අනුව චීනයෙන් ලබා ගැනීමට ඇස්තමේන්තු කළ ණය වටිනාකම එ.ජ.ඩොලර් මිලියන 312 ක් වුවද, එය එ.ජ.ඩොලර් මිලියන 969 ක් දක්වා සියයට 211 කින් වැඩි කර තිබුණු අතර එය තථ්‍ය වටිනාකමේ ඉහළම අගය විය. | චීනයෙන් ලබාගත් ව්‍යාපෘති ණය ප්‍රමාණය මෙලෙස ඉහළයාමට හේතු වූයේ එ.ජ.ඩොලර් මිලියන 809 ක් (ඇමරිකන් ඩොලර් මිලියන 500 ක් හා චීන යුවාන් මිලියන 2000 ක) වෙළෙඳපොළ ණය පහසුකමක් ඒ තුළ අන්තර්ගත වීමයි. මෙම | විධිමත් සැලසුම් සහිතව විදේශ ණය මූල්‍යනයන් සිදු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | වෙළෙඳපොළ ණය අනුමත ණය සීමාව තුළ, අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව ලබාගෙන ඇත. අවස්ථානෝචිතව ලබාගන්නා බැවින් නිශ්චිතව පුරෝකථනය කළ නොහැකිය. පැවති වෙළෙඳපොළ තත්ත්වය හමුවේ චීන සංවර්ධන බැංකුවෙන් එය ලබාගැනීම හේතුවෙන්, එය චීන ණය යටතේ පෙන්නුම් කර ඇත. | |
| (iii) | ආසියානු සංවර්ධන බැංකුවේ, ලෝක බැංකුවෙන් හා දකුණු ආසියාතික රටවල්වලින් ලබා ගත් ණයවල සත්‍ය උපලබ්ධි වටිනාකම ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සමඟ සසඳන විට, පිළිවෙළින් සියයට 58 ක්, සියයට 57 ක් සහ සියයට 40 කින් වැඩි වී තිබුණි. | 2021 වර්ෂයෙන් පසු කොවිඩ් 19 (post covid 19) තත්ත්වය පාලනය සඳහා නිර්දේශිත අතිරේක එන්නත් මාත්‍රා ලබාගැනීම වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකුව හා ලෝක බැංකුව වෙතින් හදිසි ණය පහසුකම් ලබාගත් අතර, ආර්ථිකයේ පැවති ගැටළුකාරී තත්ත්වය මගහරවා ගැනීමට ඉන්දියානු ඩොලර් ණය පහසුකම යටතේ ඒ වන විටත් අත්සන් කර තිබූ ගිවිසුම් ප්‍රකාරව, ප්‍රතිලබ්ධීන් ලබා ගැනීම 2021 වර්ෂයේදී කඩිනම් කිරීම හේතුවෙන් මෙම වැඩි වීම සිදුවී ඇත. | විධිමත් සැලසුම් සහිතව විදේශ ණය මූල්‍යනයන් කළ යුතු වීම. |
| (iv) | රුසියාව, ඔස්ට්‍රේලියාව සහ බටහිර රටවල් වලින් ද, මැදපෙරදිග රටවල්වලින්ද, කොරියාවෙන්ද, එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් සහ ජපානයෙන් ලබා ගැනීමට අපේක්ෂා කළ ණය සියයට 24 ක සිට 47 දක්වා පරාසයක ප්‍රමාණවලින් අඩු වී තිබුණි. | 2021 වර්ෂයේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් මෙම ව්‍යාපෘතිවල අපේක්ෂිත පරිදි කොන්ත්‍රාත් පිරිනැමීම, ව්‍යාපෘති සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ආනයනය කිරීමේදී සිදු වූ ප්‍රමාදයන් සහ වැඩබිම් අඛණ්ඩව පවත්වාගෙන යාමට ඇති වූ බාධාවන් හේතුවෙන් සැලසුම් කළ පරිදි ප්‍රගතිය අත්කර ගැනීමට අපොහොසත් විය. | විධිමත් සැලසුම් සහිතව විදේශ ණය මූල්‍යනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | එබැවින්, මෙම ව්‍යාපෘතිවල උපයෝජනය ණය ප්‍රතිලාභීන් අපේක්ෂිත ඉලක්කයන්ට සාපේක්ෂව අඩු අගයක් ගන්නා ලදී. | |
| (ඇ) | 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන විදේශාධාර ගිණුම් තැබීමට අදාළ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, විදේශ ආධාර සම්බන්ධ සියළු ගනුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කළ යුතු බව සඳහන් වේ. විගණනයට ලද තොරතුරු අනුව, 2021 වර්ෂයේ මහා භාණ්ඩාගාරයේ දැනුවත් වීමකින් තොරව ආයතන 3 ක් විසින් ව්‍යාපෘති 8 ක් වෙනුවෙන් එකතුව රු.මිලියන 25.52 ක විදේශ ප්‍රදාන සෘජුවම එම ආයතන විසින් ලබාගෙන තිබුණි. | 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන විදේශාධාර ගිණුම් තැබීමට අදාළ චක්‍රලේඛය හා ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ XI වෙනි පරිච්ඡේදයේ මුදල් රෙගුලාසි 610 අනුව විදේශ ආධාර සම්බන්ධ සියලුම ගනුදෙනු සිදුකිරීම හෝ අදාළ ව්‍යවස්ථාපිත ආයතන වෙත නියෝග නිකුත් කිරීමේ බලයක් මෙම දෙපාර්තමේන්තුව සතු නොවන අතර, ඒ සඳහා වන පිළිගත් පාලන ක්‍රමවේදයක් හෝ කිසිදු විධිවිධානයක් මෙම දෙපාර්තමේන්තුව වෙත ලබාදී නොමැත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රමාණවත් නොවන විට ඒවා සංශෝධනය කර හෝ විදේශාධාර ලබා ගැනීම පිළිබඳ පාලනය භාණ්ඩාගාරය වෙත ලබා ගත යුතු වීම. |
| (ඉ) | 2020 වර්ෂයේදී ශ්‍රී ලංකාව තුළ කොවිඩ් 19 රෝග ව්‍යාප්තිය ආරම්භ වීමත් සමඟ විවිධ විදේශීය රාජ්‍යයන්, දේශීය හා විදේශීය ආයතන, සංවිධාන, පුද්ගලයින් සහ දේශීය හා විදේශීය රාජ්‍ය නොවන සංවිධාන විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයට හා ඒ යටතේ රෝහල් හා අනෙකුත් සෞඛ්‍ය ආයතන වෙත මූල්‍ය හා මූල්‍ය නොවන ආධාර හා පරිත්‍යාග ලැබී තිබුණි. එම ආධාර හා පරිත්‍යාග වෙනුවෙන් ප්‍රතිපාදන සලසා ගෙන ලද ප්‍රදානයන් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. විස්තර පහත දැක්වේ. | | |

| | | | |
|---|---|---|---|
| (i) | විගණනයට තොරතුරු ඉදිරිපත් කරන ලද ආයතනවලින් ආයතන 05 ක් වෙත 2020 වර්ෂයේදී ලැබී තිබුණු රු.18,716,785 ක් වූ මූල්‍ය ආධාර හා පරිත්‍යාග අදාළ ප්‍රතිපාදන සලසා ගනිමින් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | -එම- | ප්‍රදායකයින්ගේ විශ්වාසයද තහවුරු වන පරිදි ලැබුණු විදේශ ප්‍රදාන අදාළ අරමුණුවලට යෙදවීම පිළිබඳව සම්බන්ධීකරණය හා නියාමනය ශක්තිමත් කළ යුතු වීම. |
| (ii) | විගණනයට තොරතුරු ඉදිරිපත් කරන ලද ආයතන, රෝහල් හා අංශවලින්, ආයතන හා රෝහල් සහ අංශ 16 ක් වෙත 2020 වර්ෂයේදි ලැබී තිබුණු එකතුව රු.889,071,645 ක් වටිනා භාණ්ඩ හා ආයතන, රෝහල් හා අංශ 19 ක් වෙත 2020 වර්ෂයේදී ලැබී තිබුණු වටිනාකම පිළිබඳ තොරතුරු ඇතුළත් නොවූ භාණ්ඩ ඒකක 4,956 ක් විධිමත් පරිදි ලේඛන ගත කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | -එම- | -එම- |
| (iii) | විගණනයට පසුව තොරතුරු ඉදිරිපත් කරන ලද රෝහල් හා ආයතන 60 ක් වෙත 2020 හා 2021 වර්ෂවලදී ලැබී තිබුණු එකතුව රු.1,041,492,068 ක් වටිනා භාණ්ඩ හා වටිනාකම් තක්සේරු නොකළ භාණ්ඩ අයිතම 157,509 ක් විධිමත් පරිදි ලේඛන ගත කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | -එම- | -එම- |

## 3.2 විදේශ ණය ලබා ගැනීමේදී උපයෝජනය නොවූ ණය ශේෂය සඳහා ගාස්තු ගෙවීම

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, විදේශ ණය ලබාගැනීම සඳහා ගිවිසුම් ගතවීම් හා ඊට අදාළ උපයෝජනයන් පිළිබඳ පරීක්ෂාවේදී 2016 වර්ෂයේදී ගිවිසුම්ගත වී තිබුණත්, 2020 වර්ෂය අවසාන වන විටත් එම ණය ගිවිසුම්වලට අදාළව උපයෝජනයන් සිදු නොකර පවතින ණය ශේෂ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| **(i) ණය අංක 2016015** | | |
| බෙලිඅත්ත සිට වැටිය දක්වා දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියේ මුළු පිරිවැයෙන් සියයට 85 ක් ආවරණය වන පරිදි එ.ජ.ඩොලර් 360,293,948 ක ණය මුදලක් වර්ෂ 05 ක සහන කාල පරිච්ඡේදයක් සහිතව වර්ෂ 20 කින් ආපසු ගෙවීමේ පදනම මත වරණීය ගැණුම්කරුවන්ගේ ණය පහසුකම් යටතේ ලබා ගැනීමට 2016 අප්‍රේල් 07 දින චීනයේ අපනයන ආනයන බැංකුව සමඟ ගිවිසුම්ගත වී තිබුණි. එම ගිවිසුම අනුව මුළු ණය මුදලින් උපයෝජනය නොවූ ණය මුදල මත වාර්ෂිකව සියයට 0.25 ක එකඟතා ගාස්තුවක් ගෙවිය යුතුව තිබුණි.<br><br>විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2021 ජුනි 24 දින වන විට ණය මුදල ලබා ගෙන අවසන් කළ යුතුව තිබුණත්, 2022 මැයි 15 දින වන විටත් එම ණය මුදලින් එ.ජ.ඩොලර් 279,355,795 ක් හෙවත් සියයට 88 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ණය මුදලින් සියයට 22 ක් හෙවත් එ.ජ.ඩොලර් 80,938,153 ක් උපයෝජනය කර නොතිබුණි. එම මුදල 2021 ජුනි 24 දිනෙන් පසු ලබාදීමට නොහැකි බව | මෙම ණය ගිවිසුමේ 2.2 හා 2.7 වගන්ති ප්‍රකාරව මුළු ණය මුදලින් උපයෝජනය නොවූ ණය මුදල සඳහා වාර්ෂිකව සියයට 0.25ක බැඳීම් ගාස්තුවක් ගෙවිය යුතුය. ඒ අනුව 2017.01.21 දින සිට 2020.01.21 දින දක්වා කාලය තුළ ඇ.එ.ජ. ඩොලර් 2,179,971.12ක මුදලක් ද, 2020.01.21 දින සිට 2021.07.21 දින දක්වා වූ කාලය සඳහා ඇ.එ.ජ. ඩොලර් 461,932.87ක මුදලක් ද බැඳීම් ගාස්තුව වශයෙන් ගෙවා ඇත.<br><br>මෙම ව්‍යාපෘතියේ අවසාන උපයෝජනය 2021.02.07 දින සිදු වූ අතර, මහා මාර්ග අමාත්‍යාංශය විසින් 2019 වර්ෂයේදී මෙම ව්‍යාපෘතියේ විෂය පථයේ සිදු කළ වෙනස්කම් හේතුවෙන් ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසානයේදී | ව්‍යාපෘති කඩිනමින් නිම කර බැඳීම් ගාස්තු අවම කිරීමටත්, ව්‍යාපෘති ණය පූර්ණ වශයෙන් උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| 2021 ජුනි 25 දින චීනයේ අපනයන ආනයන බැංකුව විසින් දැනුම් දී තිබුණි. ඒ අනුව මෙලෙස උපයෝජනය නොකිරීම හේතුවෙන් ලබා ගැනීමට නොහැකි වූ ණය මුදල වෙනුවෙන් වාර්ෂිකව සියයට 0.25 ක් එකඟතා ගාස්තු ලෙස වර්ෂ 05 ක් තුළ එ.ජ.ඩොලර් 2,641,904 ක් ගෙවීමට සිදු වී තිබුණි. | රු.බිලියන 12ක් පමණ ඉතිරි විය. එම ඉතිරිවීම ඵලදායීව උපයෝගී කර ගනිමින් බැදිගම හුවමාරුව සහ බෙලිඅත්ත සේවා ප්‍රදේශය ඉදිකිරීමට හා ආශ්‍රිත මාර්ග වැඩිදියුණු කිරීම සඳහා වන යෝජනාව චීන අපනයන හා ආනයන බැංකුවේ අනුමැතිය සඳහා යොමු කරනු ලැබූ නමුත්, එම ඉල්ලීම චීන අපනයන හා ආනයන බැංකුව විසින් ප්‍රතික්ෂේප කරන ලදී. එබැවින් අදාළ ඉතිරි මුදල අවලංගු කිරීම සඳහා කටයුතු සිදු කර ඇත. | |

**(ii) ණය අංක 2016034**

| | | |
|---|---|---|
| මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනට අදාළව ණය ලබාගැනීමේ ගිවිසුම් හා උපයෝජනය නොවූ ණය වෙනුවෙන් ගාස්තු ගෙවීමට අදාළ විස්තර කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවත්, 2020 වර්ෂය අවසන් වන විට මෙම ණය මුදලින් එ.ජ. ඩොලර් 19,159,283 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ණය මුදලෙන් සියයට 84.4 ක් හෙවත් එ.ජ.ඩොලර් 103,840,717 ක් උපයෝජනය කර නොතිබුණි. | මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනට අදාළ ණය මුදල සම්බන්ධ උපයෝජනය නොවූ ණය මුදල මත 2020.12.31 දක්වා ගෙවන ලද බැදීම් ගාස්තු ගෙවා ඇත. මෙම ව්‍යාපෘතියේ කි.මී.29.4ක මලාපවහන නල පද්ධතිය ඉදිකිරීම හා පොම්පාගාර දෙකක් ඉදිකිරීමේ කටයුතු 2017 වර්ෂයේ ආරම්භ කරන ලදී. ව්‍යාපෘතියේ ප්‍රධාන කොන්ත්‍රාත්තුව මේ වන විට පිරිනමා අවසන් වන අතර, ව්‍යාපෘතියේ නියමිත කාලය තුළ අවසන් කළ හැකි වෙතැයි අපේක්ෂා කෙරේ. කලට වේලාවට ව්‍යාපෘතියට අදාළ කොන්ත්‍රාත් | ව්‍යාපෘති කඩිනමින් නිම කර බැදීම් ගාස්තු අවම කිරීමටත්, ව්‍යාපෘති ණය පූර්ණ වශයෙන් උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතු වීම. |

පිරිනැමීමට නොහැකි වීම නිසා මෙම ව්‍යාපෘතියේ උපයෝජනයන් සැලසුම් කළ පරිදි සිදු කිරීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය කෙරේ.

**(iii) ණය අංක 2016021**

නාගරික සෞඛ්‍යාරක්ෂණ සහ සනීපාරක්ෂණ මුල පිරීම් ව්‍යාපෘතිය සඳහා යුරෝ මිලියන 76 ක ණය මුදලක් වර්ෂ 7 ක සහන කාලයක් සහිතව වර්ෂ 25 කින් ආපසු ගෙවීමේ පදනම මත ලබා ගැනීමට ප්‍රංශ සංවර්ධන ආයතනය සමඟ 2016 ජුනි 01 දින ගිවිසුම්ගත වි තිබුණු අතර, එහිදී මුළු ණය මුදලින් උපයෝජනය නොවූ ණය මුදල මත වාර්ෂිකව සියයට 0.5 ක බැදීම් ගාස්තුවක් ගෙවීමට එකඟ වී තිබුණි.

විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2020 වර්ෂය අවසාන වන විටත් එම ණය මුදලින් යුරෝ 2,756,563 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ණය මුදලින් සියයට 96 ක් හෙවත් යුරෝ 73,243,437 ක් උපයෝජනය කර නොතිබුණි. 2020 හා 2021 වර්ෂවල පමණක් සියයට 0.5 ක බැදීම් ගාස්තු ලෙස යුරෝ 376,855 ක් හා යුරෝ 185,499 ක් වශයෙන් එකතුව යුරෝ 562,354 ක් ගෙවා තිබුණි.

මෙම ව්‍යාපෘතියට අදාළ ශක්‍යතා අධ්‍යයනය සහ සවිස්තරාත්මක සැලැස්ම පිළියෙළ කිරීම සඳහා උපදේශන සේවා කොන්ත්‍රාත්තුව 2018 අගෝස්තු මාසයේ පිරිනමා ඇති අතර එම සැලැස්ම (Detailed Design) පිළියෙළ කිරීම 2020 වර්ෂයේ මුල් භාගයේ අවසන් වි ඇත. ණය මුදලින් සියයට 90 ක් පමණ වැය වන සිවිල් වැඩ ආරම්භ කිරීම ඉහත සවිස්තරාත්මක සැලැස්ම පිළියෙල කර අවසන් කළ පසු එයට අනුව සිදු කළ යුතු කාර්යයකි. ශක්‍යතා අධ්‍යයනය සහ සවිස්තරාත්මක සැලැස්ම අනුව, මලාපවහන පවිත්‍රාගාරය සහ මලාපවහන ජාලය ඉදිකිරීම වෙනුවෙන් ලංසු කැඳවීමේ ක්‍රියාවලිය මේ වන විට ආරම්භ කර ඇති අතර, නුදුරේම එම කටයුතු අවසන් වීමට නියමිතය.

ණය ගිවිසුමකට ඇතුළත් වීමේදී එහි මූලික මූල්‍යමය කොන්දේසියක් වන්නේ, උපයෝජනය නොවූ ශේෂය මත බැදීම් ගාස්තුවක් අය කිරීමය. ඒ අනුව, උපයෝජනය නොකළ ශේෂය මත වර්ෂයකට සියයට 0.5 ක්

ව්‍යාපෘති කඩිනමින් නිම කර බැදීම් ගාස්තු අවම කිරීමටත්, සම්පූර්ණ ණය මුදල උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතු වීම.

වූ බැඳීම් ගාස්තු මෙම ගිවිසුම අනුව ගෙවිය යුතුය.

**(iv) ණය අංක 2016039**

අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යුරෝ 52,000,000 ක ණය මුදලක් වර්ෂ 7 ක සහන කාලයක් සහිතව වර්ෂ 20 කින් ආපසු ගෙවීමේ පදනම මත ලබා ගැනීමට ප්‍රංශ සංවර්ධන ආයතනය සමඟ 2016 දෙසැම්බර් 01 දින ගිවිසුම් ගත වී තිබුණු අතර එහිදී මුළු ණය මුදලින් උපයෝජනය නොවූ ණය මුදල මත වාර්ෂිකව සියයට 0.5 ක බැඳීම් ගාස්තුවක් ගෙවීමට එකඟ වී තිබුණි.

විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2020 වර්ෂය අවසාන වන විටත් එම ණය මුදලින් යුරෝ 1,864,010 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ණය මුදලින් සියයට 96.42 ක් හෙවත් යුරෝ 50,135,990 ක් උපයෝජනය කර නොතිබුණි. 2020 හා 2021 වර්ෂවල පමණක් සියයට 0.5 ක බැඳීම් ගාස්තු ලෙස යුරෝ 127,991 ක් හා යුරෝ 251,496 ක් වශයෙන් එකතුව යුරෝ 379,487 ක් ගෙවා තිබුණි.

ගිවිසුමක් තුළ උපයෝජනය නොකළ ශේෂය මත බැඳීම් ගාස්තුවක් ලෙස වාර්ෂිකව සියයට 0.5 ක් ගෙවිය යුතු වේ.

ව්‍යාපෘතියේ විස්තරාත්මක සැලැස්ම පිළියෙල කිරීම සඳහා උපදේශන සේවා කොන්ත්‍රාත්තුවක් 2017 සැප්තැම්බර් මාසයේදී පිරිනමා ඇත. ව්‍යාපෘතියට අදාළ විස්තරාත්මක සැලැස්ම 2018 ඔක්තෝබර් මාසය අවසානයේ ලබාදිය යුතු වුව ද එය නිම කිරීමට 2021 මාර්තු මාසය දක්වා කල් ගත වී ඇත. විස්තරාත්මක සැලැස්ම පිළියෙල කිරීමේදී හඳුනාගනු ලැබූ ඉක්මනින් ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාකාරකම් (Quick win activities) සඳහා ලංසු කැඳවීම 2020 වර්ෂයේ දී සිදු කර ඇත. ඒ අනුව, එහි පළමු කොන්ත්‍රාත්තුව 2020 ජුනි/ජුලි කාලය තුළ පිරිනමා ඇත. ව්‍යාපෘතිය ද 2023 සැප්තැම්බර් 30 දින වන විට අවසන් කිරීමට නියමිතව ඇත. ඒ අනුව, ණය මුදලෙහි ඉතිරිය 2023 වර්ෂය අවසන් වනවිට උපයෝජනය වනු ඇත.

ව්‍යාපෘති කඩිනමින් නිම කර බැඳීම් ගාස්තු අවම කිරීමටත්, සම්පූර්ණ ණය මුදල උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතු වීම.

**(v) ණය අංක 2016023**

| | | |
|---|---|---|
| ආනමඩුව ඒකාබද්ධ ජලසම්පාදන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා යුරෝ 29,501,875 ක ණය මුදලක් වර්ෂ 4 ක සහන කාලයක් සහිතව වර්ෂ 40 කින් ආපසු ගෙවීමේ පදනම මත ලබා ගැනීමට ස්පාඤ්ඤ රජය සමඟ 2016 පෙබරවාරි 16 දින ගිවිසුම්ගත වී තිබුණි. එහිදී මුළු ණය මුදලින් උපයෝජනය නොවූ ණය මුදල මත වාර්ෂිකව සියයට 0.10 ක බැඳීම් ගාස්තුවක් ගෙවීමට එකඟ වී තිබුණි. විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2020 වර්ෂය අවසාන වන විටත් එම ණය මුදලින් යුරෝ 12,227,405 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ණය මුදලින් සියයට 58.55 ක් උපයෝජනය කර නොතිබුණි. 2020 වර්ෂයට පමණක් සියයට 0.5 ක බැඳීම් ගාස්තු ලෙස යුරෝ 18,223 ක් ගෙවා තිබුණි. | මෙම ගිවිසුම සඳහා බැඳීම් ගාස්තු ලෙස උපයෝජනය නොකළ ශේෂය මත සියයට 0.1 ක් වර්ෂයකට ගෙවිය යුතු වේ.<br><br>ව්‍යාපෘතිය 2020 මැයි මාසය වනවිට අවසන් වීමට නියමිතව තිබුණ ද, ජල පවිත්‍රාගාරයේ ඉදිකිරීම, ජලය ලබා ගන්නා ස්ථානය පිළිබඳව සිදු වූ වෙනස්වීම්, ජලනල සඳහා අනුමැතිය ලබා ගැනීමේදී සිදු වූ ප්‍රමාදයන් හේතුවෙන් නියමිත කාලය තුළ ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකි විය. එම නිසා ව්‍යාපෘති කාලය 2022 මැයි මාසය දක්වා දීර්ඝ කර ඇත. ඒ අනුව 2020 වර්ෂය වනවිට උපයෝජනය නොවූ ශේෂයක් පවතී. මේ වනවිට මුළු උපයෝජනය යුරෝ මිලියන15.3ක් වේ. | ව්‍යාපෘති කඩිනමින් නිම කර බැඳීම් ගාස්තු අවම කිරීමටත්, සම්පූර්ණ ණය මුදල උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතු වීම. |

**(vi) ණය අංක - 2016019**

| | | |
|---|---|---|
| විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යුරෝ 123,728,034 ක ණය මුදලක් වර්ෂ 3 ක සහන කාලයක් සහිතව වර්ෂ 15 කින් ආපසු ගෙවීමේ පදනම මත ලබා ගැනීමට ප්‍රංශයේ ක්‍රෙඩිට් ඇග්‍රිකෝල් ඉන්වෙස්මන්ට් බැංකුව, නැටික්ස් බීඑන්පී පැරිබාස් සහ ඔස්ට්‍රියාවේ යුනි ක්‍රෙඩිට් බැංකුව සමඟ 2016 අප්‍රේල් 25 දින ගිවිසුම්ගත වී තිබුණි. එහිදී මුළු ණය මුදලින් උපයෝජනය නොවූ ණය මුදල මත වාර්ෂිකව සියයට 0.75 ක බැඳීම් ගාස්තුවක් ගෙවිමට එකඟ වී තිබුණි.<br><br>විගණනයට ඉදිරිපත් කළ තොරතුරු | මෙම ගිවිසුම සඳහා බැඳීම් ගාස්තු ලෙස උපයෝජනය නොකළ ශේෂය මත වාර්ෂිකව සියයට 0.75 ක් ගෙවිය යුතුය.<br><br>මෙම ව්‍යාපෘතියේ කටයුතු 2019 සැප්තැම්බර් 25 දින වන විට අවසන් වීමට නියමිතව තිබුණ ද රත්තොට ජල පවිත්‍රාගාරය සහ අඹන්ගග ජල පවිත්‍රාගාරය ඉදිකරනු ලබන ස්ථානයන් හි සිදුවූ වෙනස් වීම්, රත්තොට ජලය ලබා ගැනීමේ මූලාශ්‍රය සම්බන්ධයෙන් | ව්‍යාපෘති කඩිනමින් නිම කර බැඳීම් ගාස්තු අවම කිරීමටත්, සම්පූර්ණ ණය මුදල උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතු වීම. |

| | |
|---|---|
| අනුව 2020 වර්ෂය අවසාන වන විටත් එම ණය මුදලින් යුරෝ 85,789,907 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ණය මුදලින් සියයට 30.66 ක් හෙවත් යුරෝ 37,938,128 ක් උපයෝජනය කර නොතිබුණි. 2020 වර්ෂයට පමණක් සියයට 0.75 ක බැදීම් ගාස්තු ලෙස යුරෝ 368,283 ක් ගෙවා තිබුණි. | ඇති වූ ගැටලු, ජලනල බෙදා හැරීමේ වූ ප්‍රමාදයන් වැනි හේතු නිසා නියමිත කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට නොහැකි විය. ව්‍යාපෘති කාලය 2022 පෙබරවාරි 17 දින දක්වා දීර්ඝ කර ඇත. මේ වනවිට මෙහි මුළු උපයෝජනය යුරෝ මිලියන 107ක් වේ. |

(ආ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, විදේශ ණය ලබාගැනීම සඳහා ගිවිසුම් ගතවීම් හා ඊට අදාළ උපයෝජනයන් පිළිබඳ පරීක්ෂාවේදී නියැදි පදනම මත තෝරාගත්, 2014 වර්ෂයේදී ගිවිසුම්ගත වී ඇති නමුත් 2021 වර්ෂය අවසාන වන විටත් එම ණය ගිවිසුම්වලට අදාළව උපයෝජනය නොවී පවතින ණය ශේෂයන් හා ඊට අදාළ ගෙවීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

**(i) ණය අංක - 2014040**

| | | |
|---|---|---|
| මාතර සිට බෙලිඅත්ත දක්වා දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා එ.ජ.ඩොලර් 683,494,300 ක ණය මුදලක් වර්ෂ 5 ක සහන කාලයක් සහිතව වර්ෂ 20 කින් ආපසු ගෙවීමේ පදනම මත වරණීය ගැණුම්කරුගේ ණය පහසුකම යටතේ ලබා ගැනීමට චීනයේ අපනයන ආනයන බැංකුව සමඟ 2014 දෙසැම්බර් 23 දින ගිවිසුම්ගත වී තිබුණි. එම මුළු ණය මුදලින් උපයෝජනය නොවූ ණය මුදල මත වාර්ෂිකව සියයට 0.25 ක බැදීම් ගාස්තුවක් ගෙවීමට එකඟ වී තිබුණි. | මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් 2019.11.09 දින වන විට අවසන් වූ අතර ව්‍යාපෘතියේ විෂය අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන මහා මාර්ග අමාත්‍යාංශය විසින් සීමා කිරීම හේතුවෙන් හා විනිමය අනුපාත වෙනස් වීම හේතුවෙන් රු.බිලියන 3.5 ක පමණ ඉතිරියක් සිදු වී තිබුණි. මෙම ඉතිරි වීම ඵලදායීව උපයෝගී කර ගනිමින් මෙම කොටසේ අන්තර් හුවමාරු සඳහා ප්‍රවේශ මාර්ග ඉදිකිරීම සඳහා වූ ඉල්ලීම චීන අපනයන හා ආනයන බැංකුව වෙත ඉදිරිපත් කළද එය | ව්‍යාපෘති කඩිනමින් නිම කර බැදීම් ගාස්තු අවම කිරීමටත්, සම්පූර්ණ ණය මුදල උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2021 ජුනි 24 දින වන විට විටත් එම ණය මුදලින් එ.ජ.ඩොලර් 663,982,749 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ණය මුදලින් සියයට 3 ක් හෙවත් එ.ජ.ඩොලර් 19,511,551 ක් උපයෝජනය කර නොතිබුණි. 2020 වර්ෂයට පමණක් සියයට 0.25 ක බැදීම් ගාස්තු ලෙස එ.ජ.ඩොලර් 56,089,787 ක් ගෙවා තිබුණි. | අනුමත නොකරන ලදී. | |

**(ii) ණය අංක 2014024**

| | | |
|---|---|---|
| පිටත වට රවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ කඩවත සිට කෙරවලපිටිය දක්වා කොටස ක්‍රියාත්මක කිරීම සඳහා එ.ජ.ඩොලර් 494,037,400 ක ණය මුදලක් වර්ෂ 5 ක සහන කාලයක් සහිතව වර්ෂ 20 කින් ආපසු ගෙවීමේ පදනම මත වරණීය ගැනුම්කරුගේ ණය පහසුකම යටතේ ලබා ගැනීමට චීනයේ අපනයන ආනයන බැංකුව සමඟ 2014 සැප්තැම්බර් 16 දින ගිවිසුම්ගත වී තිබුණි. එම මුළු ණය මුදලින් උපයෝජනය නොවූ ණය මුදල මත වාර්ෂිකව සියයට 0.25 ක බැඳීම් ගාස්තුවක් ගෙවීමට එකඟ වී තිබුණි. විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2021 ජුනි 24 දින වන විට විටත් එම ණය මුදලින් එ.ජ.ඩොලර් 353,309,162 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ණය මුදලින් සියයට 28 ක් හෙවත් එ.ජ.ඩොලර් 140,728,238 ක් උපයෝජනය කර නොතිබුණි. 2020 වර්ෂයට පමණක් සියයට 0.25 ක බැදීම් ගාස්තු ලෙස එ.ජ.ඩොලර් 32,212,172 ක් ගෙවා තිබුණි. | මෙම ව්‍යාපෘතියට අදාළ ණය ගිවිසුමේ උපයෝජනය කළ හැකි කාල සීමාව 2020.10.26 දින අවසන් වූ අතර ව්‍යාපෘතියේ විෂය පථය සීමා වීම හා රටේ පැවති මූල්‍ය තත්ත්වය සලකා බලා අත්‍යාවශ්‍ය කටයුතු පමණක් නිම කිරීම හේතුවෙන් රු. බිලියන 20.9 ක පමණ ඉතිරියක් සිදු වී තිබුණි. මෙම ඉතිරි වීම ඵලදායීව උපයෝගී කර ගනිමින් මෙම කොටසේ අතිරේක ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට මහා මාර්ග අමාත්‍යාංශය හා එක්ව චීන අපනයන හා ආනයන බැංකුව වෙත ඉදිරිපත් කළද එය අනුමත නොකරන ලදී. | ව්‍යාපෘති කඩිනමින් නිම කර බැදීම් ගාස්තු අවම කිරීමටත්, ව්‍යාපෘති ණය පූර්ණ වශයෙන් උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතු වීම. |

**(iii) ණය අංක 2014025**

| | | |
|---|---|---|
| මත්තල සිට අන්දරවැව හරහා හම්බන්තොට දක්වා දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රෙන්මින්බී යුවාන් 2,528,171,834 ක ණය මුදලක් වර්ෂ 5 ක සහන | මෙම ව්‍යාපෘතියට අදාළ ණය ගිවිසුමේ උපයෝජනය කළ හැකි කාල සීමාව 2020.10.26 දින අවසන් වූ අතර ව්‍යාපෘතියේ වැඩ කටයුතු | ව්‍යාපෘති කඩිනමින් නිම කර බැදීම් ගාස්තු අවම කිරීමටත්, ව්‍යාපෘති ණය පූර්ණ වශයෙන් උපයෝජනය කිරීමටත් කටයුතු |

| | | |
|---|---|---|
| කාලයක් සහිතව වර්ෂ 20 කින් ආපසු ගෙවීමේ පදනම මත ලබා ගැනීමට චීනයේ අපනයන ආනයන බැංකුව සමඟ 2014 සැප්තැම්බර් 16 දින ගිවිසුම්ගත වි තිබුණි. එම මුළු ණය මුදලින් උපයෝජනය නොවූ ණය මුදල මත වාර්ෂිකව සියයට 0.25 ක බැඳීම් ගාස්තුවක් ගෙවීමට එකඟ වී තිබුණි.<br><br>විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2021 ජුනි 24 දින වන විට විටත් එම ණය මුදලින් රෙන්මින්බි යුවාන් 1,987,801,117 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ණය මුදලින් සියයට 21 ක් හෙවත් රෙන්මිබින් යුවාන් 540,370,717 ක් උපයෝජනය කර නොතිබුණි. 2020 වර්ෂයට පමණක් සියයට 0.25 ක බැඳීම් ගාස්තු ලෙස රෙන්මින්බි යුවාන් 51,295,324 ක් ගෙවා තිබුණි. | කෙරෙහි COVID 19 වසංගත තත්ත්වය හේතුවෙන් රෙන්මින්බි යුවාන් මිලියන 540 ක් පමණ ඉතිරි විය. මෙම ඉතිරි වීම ඵලදායීව උපයෝගී කර ගනිමින් මෙම ව්‍යාපෘතිය ආශ්‍රිත මාර්ගවල ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට මහාමාර්ග අමාත්‍යාංශය හා එක්ව චීන අපනයන හා ආනයන බැංකුව වෙත ඉදිරිපත් කළද එය අනුමත නොකරන ලදී. | කළ යුතු වීම. |

**(iv) ණය අංක 2014026**

| | | |
|---|---|---|
| හම්බන්තොට ජාත්‍යන්තර කේන්ද්‍රයේ මාර්ග සහ ගුවන් පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රෙන්මින්බි යුවාන් 1,555,995,249 ක ණය මුදලක් වර්ෂ 5 ක සහන කාලයක් සහිතව වර්ෂ 20 කින් ආපසු ගෙවීමේ පදනම මත ලබා ගැනීමට චීනයේ අපනයන ආනයන බැංකුව සමඟ 2014 සැප්තැම්බර් 16 දින ගිවිසුම්ගත වී තිබුණු අතර, එහිදී මුළු ණය මුදලින් උපයෝජනය නොවූ ණය මුදල මත වාර්ෂිකව සියයට 0.25 ක බැඳීම් ගාස්තුවක් ගෙවීමට එකඟ වී තිබුණි. | මෙම ව්‍යාපෘතියට අදාළ ණය ගිවිසුමේ උපයෝජනය කළ හැකි කාල සීමාව 2020.10.26 දින අවසන් වූ අතර ව්‍යාපෘතියේ වැඩ කටයුතු කෙරෙහි COVID 19 වසංගත තත්ත්වය හේතුවෙන් රෙන්මින්බි යුවාන් මිලියන 27 ක් පමණ ඉතිරි විය. මෙම ඉතිරි වීම ඵලදායීව උපයෝගී කර ගනිමින් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම සඳහා මහා මාර්ග අමාත්‍යාංශය හා එක්ව චීන අපනයන හා ආනයන බැංකුව වෙත යෝජනාවක් ඉදිරිපත් කළද එය අනුමත නොකරන ලදී. | ව්‍යාපෘති කඩිනමින් නිම කර බැඳීම් ගාස්තු අවම කිරීමටත්, ව්‍යාපෘති ණය පූර්ණ වශයෙන් උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතු වීම. |

විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2021 ජුනි 24 දින වන විට විටත් එම ණය මුදලින් රෙන්මින්බී යුවාන් 1,554,505,538 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ණය මුදලින් සියයට 1 ක් හෙවත් රෙන්මිබින් යුවාන් 1,489,711 ක් උපයෝජනය කර නොතිබුණි. 2020 වර්ෂයට පමණක් සියයට 0.25 ක බැඳීම් ගාස්තු ලෙස රෙන්මිබින් යුවාන් 18,918,566 ක් ගෙවා තිබුණි.

**(v) ණය අංක 2014027**

අඹතලේ ජලසම්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීමේ හා බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා එ.ජ.ඩොලර් 70,000,000 ක ණය මුදලක් වර්ෂ 7 ක සහන කාලයක් සහිතව වර්ෂ 25 කින් ආපසු ගෙවීමේ පදනම මත වරණීය ගැනුම්කරුගේ ණය පහසුකම යටතේ ලබා ගැනීමට ප්‍රංශයේ Agence Francaise de Development (AFD) බැංකුව සමඟ 2014 සැප්තැම්බර් 29 දින ගිවිසුම්ගත වී තිබුණි. එම මුළු ණය මුදලින් උපයෝජනය නොවූ ණය මුදල මත වාර්ෂිකව සියයට 0.5 ක බැඳීම් ගාස්තුවක් ගෙවීමට එකඟ වී තිබුණි.

විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2021 ජුනි 24 දින වන විටත් එම ණය මුදලින් එ.ජ.ඩොලර් 16,870,469 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ණය මුදලින් සියයට 76 ක් හෙවත් එ.ජ.ඩොලර් 53,129,531 ක් උපයෝජනය කර නොතිබුණි. 2020 වර්ෂයට පමණක් සියයට 0.5 ක බැඳීම් ගාස්තු ලෙස එ.ජ.ඩොලර් 53,132,020 ක් ගෙවා තිබුණි.

මෙම ව්‍යාපෘතියේ කටයුතු 2019 වර්ෂය අවසන් වන විට නිම කිරීමට මූලිකව ඇස්තමේන්තු කර තිබුණි. නමුත් ප්‍රසම්පාදනයේ සිදු වූ ප්‍රමාදයන්, කොන්ත්‍රාත්කරුවන්ගේ සිදු වන ප්‍රමාදයන් මෙන්ම කොන්ත්‍රාත්කරුවන්ගේ ආයතනමය කළමනාකරණ ගැටළු හේතුවෙන් සමහර කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් ඇති වී ඇත.

ව්‍යාපෘති කඩිනමින් නිම කර බැඳීම් ගාස්තු අවම කිරීමටත්, ව්‍යාපෘති ණය පූර්ණ වශයෙන් උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතු වීම.

**3.3 වත්කම් කළමනාකරණය**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව සතු වාහන දෙකක් මුදල් අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණු අතර ඉන් එක් වාහනයක වටිනාකම දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවල හෝ මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල ද ඇතුළත් කර නොතිබුණි. | WP JV – 1448 දරන කැබ්රථය මුදල් අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වාහනයක් වන අතර, මෙම දෙපාර්තමේන්තුව භාරයේ පැවති එම වාහනය භාරදීමේදී, එහි වත්කම් වටිනාකම මෙම දෙපාර්තමේන්තුවේ ලේඛන වලින් ඉවත් කර ඇත. මෙම වත්කම් මුදල් අමාත්‍යාංශයේ වත්කම් ලේඛනවලට ඇතුළත් කිරීම සඳහා දැනුම් දී ඇති අතර, ඒ සඳහා එම අමාත්‍යාංශය කටයුතු කරන බව දන්වා ඇත. | දෙපාර්තමේන්තුව සතු වත්කම් නිවැරදිව හඳුනා ගැනීම හා ලේඛන ගත කළ යුතු වීම. |
| (ආ) | 2021 දෙසැම්බර් 22 දින කාර්යාලයීය වානේ අල්මාරි 30 ක් මිලදී ගැනීමට කටයුතු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් වානේ අල්මාරි 11 ක් ලැබී තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් වානේ අල්මාරි 30 කට අදාළව රු.1,108,080 ක් වූ ඉන්වොයිස් පත 2021 දෙසැම්බර් 22 දින දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණි. 2021 දෙසැම්බර් 30 දින ලැබී තිබුණු වානේ අල්මාරි 11 ට පමණක් ගෙවීම් කර තිබුණි. ඉතිරි වානේ අල්මාරි 19 ක් 2022 වර්ෂයේදී ලැබී තිබුණි. ඒ සඳහා 2022 මාර්තු 23 දිනැති රු.701,784 ක වටිනා ඉන්වොයිස්පතක් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණි. මෙම ගනුදෙනුවට අදාළව ඉන්වොයිස්පත් දෙකක් දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණු අතර මුල් ඉන්වොයිස් | 2021 වර්ෂයේ කාර්යාලයීය වානේ අල්මාරි 30ක් මිලදී ගැනීමට කටයුතු කර තිබුණු අතර, නිසි ප්‍රමිතියට අනුකූලව තිබූ කබඩ් 11 සඳහා පමණක් ගෙවීම කළ අතර, ඉතිරි කබඩ් 19 නිසි පරිදි සකස් කර නැවත ගෙන්වා ගැනීමේදී සිදු වූ ප්‍රමාදය හේතුවෙන් 2021 වර්ෂයේදී ඒ සඳහා ගෙවීම් කළ නොහැකි වූ බැවින්, කබඩ් 30 වෙනුවෙන් ඉදිරිපත් කළ ඉන්වොයිස්පතට අදාළව කබඩ් 11ක් සඳහා පමණක් ගෙවීම් කර ඇත. | 2021 වර්ෂයේදී බැරකම් නිවැරදි ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු වීම. |

පතේ සඳහන් ප්‍රමාණය (Quantity) වෙනස් නොකොට දෙවැනි ඉන්වොයිස්පත සඳහා ගෙවීම් කර තිබුණි. 2021 වර්ෂයේදී ලැබී නොතිබුණු භාණ්ඩවලට අදාළ රු.701,787 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බැරකමක් ලෙස දක්වා තිබුණි.

## 4. මානව සම්පත් කළමනාකරණය

------------------------------------

### 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

----------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ පැවති පුරප්පාඩු 26 තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 10 ක් පැවතුණි. | තනතුරු 03 ක් තවදුරටත් අවශ්‍ය නොවන බැවින් 2022.03.23 දිනැතිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් එම තනතුරු යටපත් කර ඇත.<br><br>ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු වාර්ෂික ස්ථාන මාරු යටතේ 2022 වර්ෂයේ සම්පූර්ණ කිරීමට නියමිතව පැවති අතර, මේ වන විට පුරප්පාඩුවලින් පුරප්පාඩු 3ක් සම්පූර්ණ කර ඇත. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීමට ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් රඳවා ගැනීමටත් අත්‍යාවශ්‍ය නොවන තනතුරු තිබේනම් ඒවා සංශෝධනය කර ගැනීමටත් කටයුතු කළ යුතු වීම. |